# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2021 නොවැම්බර්

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය**

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2021 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 11.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය ඔක්තෝම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 8.3%ක් ලෙස වාර්තා විය. 2021 නොවැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 7.8%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.3%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2020 නොවැම්බර් මාසයේ 5.2%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.2%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.0%ක් විය. 2020 නොවැම්බර් මාසයට සාපේක්ෂව 2021 නොවැම්බර් මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2021 ඔක්තෝම්බර් මාසයේ 11.7% සිට 2021 නොවැම්බර් මාසයේදී 16.9% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2021 ඔක්තෝම්බර් මාසයේ 5.4% සිට 2021 නොවැම්බර් මාසයේදී 6.2% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2021 ඔක්තෝම්බර් මාසයේ 150.6ක් වූ දර්ශකාංකය 2021 නොවැම්බර් මාසයේ 155.3ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2021 නොවැම්බර් මාසයේ දර්ශකාංකය 4.7ක වැඩිවීමක් එනම් 3.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 2.61%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.53%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට එළවළු, සහල්, කිරිපිටි, ලොකු ළූණු, අළුත් මාළු, කුකුල් මස්, අර්තාපල්, පොල්, සීනි, පාන්, දෙහි, බිත්තර, තිරිඟු පිටි, මයිසූර් පරිප්පු, බිස්කට්, ළදරු කිරිපිටි, බනිස්, අමු මිරිස්, සුදු ළූණු, රතු ළූණු සහ සෝයා මීට් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. කෙසේ වෙතත් මුං ඇට, පොල්තෙල්, කරවල, පළතුරු, සහ කව්පි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2021 නොවැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(අරක්කු සහ සිගරට්)*, 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(LP ගෑස්)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල් සහ වාහන සේවා ගාස්තු)*, 'ආපනශාලා සහ හෝටල් සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2021 ඔක්තෝම්බර් මාසයේ 7.2% සිට 2021 නොවැම්බර් මාසයේ 8.8% දක්වා වැඩිවීමක් වාර්තා විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2020** | නොවැ. | 139.8 | 146.7 | 134.3 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 9.4 | 1.7 | 4.5 |
| | දෙසැ. | 141.2 | 149.9 | 134.3 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 7.5 | 2.2 | 4.7 |
| **2021** | ජන. | 142.1 | 151.4 | 134.7 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 5.9 | 1.8 | 4.2 |
| | පෙබ. | 142.8 | 152.8 | 134.9 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 6.9 | 1.9 | 4.1 |
| | මාර්තු | 142.1 | 150.7 | 135.3 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 8.8 | 2.0 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 150.8 | 135.5 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 9.7 | 2.2 | 4.1 |
| | මැයි | 143.6 | 153.3 | 135.9 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 10.3 | 2.5 | 4.2 |
| | ජූනි | 145.7 | 157.3 | 136.5 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 9.8 | 2.9 | 4.1 |
| | ජූලි | 146.6 | 158.5 | 137.2 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 11.0 | 3.2 | 4.4 |
| | අගෝ. | 147.1 | 159.4 | 137.4 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 11.1 | 3.0 | 4.7 |
| | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව